Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# ගුරු සිසු සබඳතාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් ඃ රජයේ සහ ජාත්‍යන්තර පාසල් ඇසුරින්

*එම්. එම්. ටී. සිල්වා*[1]

*කේ කරුණාතිලක*[2]

**සංක්ෂේපය**

පුද්ගලයා උපතේ සිට විපත දක්වාත් ඔහුගේ ජීවිතයේ සෑම අංශයක් පිළිබඳවත් ඉගෙනුම් ක්‍රියාවලියේ නිරත වේ. මෙහිදී ඔහු පාසල් පන්ති කාමරයෙන් පමණක් සීමා නොවී අවිධිමත්වද අධ්‍යාපනය ලබයි. නමුත් අධ්‍යාපනය සම්බන්ධ විවිධ සාධකයන් අතර තවමත් විධිමත් අධ්‍යාපනය ලබාදෙන පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියට ඉතා වැදගත් තැනක් හිමි වේ. දරුවන්ට තම දෙමාපියන් හැරුණු විට ඊළඟට තම සමීපතමයන් වන්නේ පාසල් ගුරුවරයාය. ඒ අනුව ගුරුවරයා හා ශිෂ්‍යයා අතර ඇත්තේ අවියෝජනීය බැඳීමකි. ගුරුවරයා හා ශිෂ්‍යයා ඔවුන් පිළිබඳ ඇති කරගන්නා ආකල්ප හා දක්වන ප්‍රතිචාරයන් මත එම බැඳීම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකිය.

ඒ අනුව සිදුකරන ලද පර්යේෂණයේ මූලික අරමණ වූයේ ගුරු සිසු සබඳතාවයේ ස්වභාවය සැලකීමේදී රජයේ සහ ජාත්‍යන්තර පාසල් අතර වෙනස්කම් පවතින්නේදැයි හඳුනාගැනීමයි. මෙය ප්‍රමාණාත්මකව සිදුකරන ලද පර්යේෂණයක් වන බැවින් සමීක්ෂණ විධික්‍රමය භාවිත කරමින් ප්‍රශ්නාවලී ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. මෙහි පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස මීගමුව අධ්‍යාපන කලාපයේ පාසල් දෙකක් දෙකක් තෝරා ගනු ලැබීය. එහිදී රජයේ පාසල ලෙස සීදූව දවිසමර මහා විද්‍යාලයත්, ජාත්‍යන්තර පාසල ලෙස මීගමුව නිගම්බු සවුත් විද්‍යාලයත් තෝරා ගනු ලැබීය. පර්යේෂණයේ නියදිය ලෙස සසම්භාවී නොවන නියදිය යටතේ අරමුණුගත නියදියට අනුව අහඹු ලෙස, පාසල් දෙකෙන්ම සිසුන් 50 දෙනෙකු සහ ගුරුවරු 50 දෙනෙකුද වන සේ 100 දෙනෙකු ඇතුළත් කර ගනු ලැබීය.

මෙම පර්යේෂණයේදී ලබාගත් තොරතුරුවලට අනුව අනාවරණය වූයේ ජාත්‍යනන්තර පාසල්වලට සාපේක්ෂව රජයේ පාසල් තුළ ගුරු සිසු සබඳතාව සමීප තත්වයක පවතින බවත් රජයේ පාසල් ගුරුවරුන් තම ශිෂ්‍යයන් පිළිබඳ ධනාත්මක ආකල්ප හා ප්‍රතිචාරයන් දක්වන අතර එම පාසල් සිසුන්ද ජාත්‍යන්තර පාසල් සිසුන්ට සාපේක්ෂව තම ගුරුවරු පිළිබඳ ධනාත්මක ආකල්පයන් දරන බව අනාවරණය විය. මෙහිදී ඔවුන් දෙපාර්ශවයේම ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය, ගරුත්වය, ආකල්ප, දක්වන ප්‍රතිචාර, අවබෝධය සහ හැසිරීම් ආදි කරුණු මත සබඳතාවයේ ස්වරූපය තීරණය වී ඇත.

1.සමාජ විද්‍යා අධ්‍යයන අංශය, mmthamali@gmail.com

2. සමාජ විද්‍යා අධ්‍යයන අංශය, kkaru@kln.c.lk,